ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 අධිකාරියේ) 5 සහ 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 අහිතකර මතය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.87,847,467 ක දායක මුදල්, ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට ලද මුදලක් ලෙස ලැබීම් හා ගෙවීම් ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ආ) අරමුදල සඳහා වයඹ, දකුණ හා නැගෙනහිර යන පළාත් තුනෙන් පිරිවෙන් හා අර්ධ පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගෙන් දායක මුදල් රැස්කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 253 දරන විසර්ජන ශීර්ෂයෙන් ගෙවනු ලබන අතර, එකී වියදම හඳුනාගෙන අරමුදලේ වියදම ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2. විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් හා ඊට අදාල ගනුදෙනු සටහන් කරන ලද මුදල් පොතක් නඩත්තු කර නොතිබූ හෙයින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අරමුදලට ලැබුණු හා ගෙවන ලද මුදල් පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

### 2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

----------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1953 අංක 44 දරන පාථශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) | එක් එක් ආධාර මුදල් ගෙවන්නන්ගේ දායක මුදල, ආණ්ඩුව විසින් අරමුදල සඳහා ගෙවන ලද සියළු ආධාර මුදල් පිළිබඳ විස්තර හා ආධාර මුදල් ගෙවන්නෙකුගේ මරණයේදී ඔහුට ගෙවිය යුතුව තිබෙන ආධාර මුදල් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වා ගත යුතු වුවත්, එවැනි ලේඛන පවත්වා නොතිබුණි. ඒ අනුව කේවල ගිණුම් පවත්වා නොගැනීම හේතුවෙන් ඒ ඒ දායකයාට හිමි |

විය යුතු මුදල හා දායකයා විසින් ගෙවන ලද මුදල හා පොළිය නිශ්චිතව හදුනාගැනීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 (අ) ඡේදය | වාර්ෂික අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

--------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.137,046,345 ක අතිරික්තය වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.119,639,248 ක්, වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,407,097 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආපසු ගෙවීම් රු.970,313 කින් එනම් සියයට 11 කින් පහළ යාමද, පොළී ආදායම රු.12,805,838 කින් එනම් සියයට 29 කින් හා දායක මුදල් ලැබීම් රු.5,151,035 කින් එනම් සියයට 6 කින් ඉහළ යාම, අතිරික්තයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 මෙහෙයුම් කාර්යසාධනය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දායක මුදල් ප්‍රේෂණය කළ යුතු පිරිවෙන් හා අර්ධ පෞද්ගලික පාසල්වල තොරතුරු සහ ලැබුණු මාසික මුදලේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අරමුදල සතුව ප්‍රමාණවත් වූ වැඩපිළිවෙලක් නොතිබුණි.

(ආ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව පිළිබඳ විස්තර පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) මාසික සමාජික දායක මුදල් ලැබීම් රුපියල් මිලියන 2.6 සිට රුපියල් මිලියන 14.1 අතර පරාසයක පැවතුන අතර එක් එක් මාසයන්හි දායක මුදල් ලැබීම්වල උච්චාවචනයන් නිරීක්ෂණය විය. මාසික ලැබිය යුතු දායක මුදල කොපමණද යන්න ගණනය කිරීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් මිලියන 56.9 ක පොළී ආදායමක් අරමුදලට ලැබී තිබුණද, එම මුදලින් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා කිසිදු මුදලක් යොදා ගෙන නොතිබු අතර අරමුදලේ දායක මුදල් ආපසු ගෙවීම සඳහා රුපියල් මිලියන 7.7 ක් වැය කර ඉතිරි රුපියල් මිලියන 49.2 ආයෝජනය කර තිබුණි.

(ඉ) භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් පනවා ඇති නියෝග සුදුසු පරිදි සංශෝධනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර තිබුණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අවකරණ ලේඛන
(ඇ) ආයෝජන
(ඇ) සාමාජිකයන්ගේ කේවල ගිණුම්